# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1783/17 - 2012 නොවැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2012.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2012 නොවැම්බර් මස 09 වැනි දින සිට ආරම්භ වන මාස 04 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2012 මැයි මස 11 වැනි දිනැති අංක 1757/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින්, උම්බලකඩ (සංයෝජිත වර්ගීකරණ අංක 0305.59.10), උඳු (සංයෝජිත වර්ගීකරණ අංක 0713.31.90), මිදි (සංයෝජිත වර්ගීකරණ අංක 0806.10), මිරිස් (කුඩුකළ හෝ ඇඹරූ/ සංයෝජිත වර්ගීකරණ අංක 0904.20.12), කොත්තමල්ලි (කුඩුකළ හෝ ඇඹරූ/සංයෝජිත වර්ගීකරණ අංක 0909.20.20), සූදුරු බීජ (සංයෝජිත වර්ගීකරණ අංක 0909.30), කහ (කුඩුකළ, සංයෝජිත වර්ගීකරණ අංක 0910.30.90), රටකජු (සංයෝජිත වර්ගීකරණ අංක 1202.20), අබ ඇට (සංයෝජිත වර්ගීකරණ අංක 1207.50), එළවලු තෙල් (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 15.07, 15.11,15.12,15.13) සහ 2012 සැප්තැම්බර් මස 18 වැනි දිනැති අංක 1776/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ටින් මාලු (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 16.04) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2012 නොවැම්බර් මස 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| 1. | 03.05 | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි.ග්‍රෑමයට රු.275 |
| 2. | 07.13 | 0713.31.90 | උඳු | කි.ග්‍රෑමයට රු.110 |

1A - PG 001436 — 980 (2012/11)

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| 3. | 08.06 | 0806.10 | මිදි - අළුත් | කි.ග්‍රෑමයට රු.130 |
| 4. | 09.04 | 0904.22.10 | මිරිස් - කුඩුකළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු.150 |
| | | 0904.22.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.150 |
| 5. | 09.09 | 0909.22 | කොත්තමල්ලි බීජ - ඇඹරූ හෝ කුඩුකළ | කි.ග්‍රෑමයට රු.200 |
| 6. | | 0909.31 | කුඩු නොකළ සහ නොඇඹරූ සූදුරු බීජ | කි.ග්‍රෑමයට රු.160 |
| | | 0909.32 | කුඩු කළ හෝ ඇඹරූ සූදුරු බීජ | කි.ග්‍රෑමයට රු.160 |
| 7. | 09.10 | 0910.30.90 | කහ - අනෙකුත් | කි.ග්‍රෑමයට රු.500 |
| 8. | 12.02 | 1202.42 | රටකජු - පොතු හරින ලද, | කි.ග්‍රෑමයට රු.110 |
| 9. | 12.07 | 1207.50 | අබ ඇට | කි.ග්‍රෑමයට රු.60 |
| 10. | 15.07 | | ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, සෝයා බෝංචි තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | 1507.10 | මැලියම් ඉවත් කළ හෝ නොකළ අශුද්ධ තෙල් | කි.ග්‍රෑමයට රු.80 |
| | | 1507.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.110 |
| | 15.11 | | ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | 1511.10 | ශුද්ධ නොකළ තෙල් | කි.ග්‍රෑමයට රු.80 |
| | | 1511.90 | අනෙකුත් | |
| | | 1511.90.10 | කාමර උෂ්ණත්වයේ ඇති අනුක්‍රමික කොටස් (පාම් ස්ටියරින්) | කි.ග්‍රෑමයට රු.80 |
| | | 1511.90.20 | ලීටර් 210 හෝ ඊට අඩු ප්‍රමාණයන්ගෙන් අසුරා ආනයනය කරනු ලබන පාම් තෙල් | කි.ග්‍රෑමයට රු.110 |
| | | 1511.90.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.110 |
| | 15.12 | | ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, සූරියකාන්ත ඇටවල තෙල්, සප්ෆ්ලවර් හෝ කපු ඇට තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | | සූර්ය කාන්ත ඇටවල තෙල් හෝ ස්ප්ෆ්ලවර් තෙල් හා ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | 1512.11 | ශුද්ධ නොකළ තෙල් | කි.ග්‍රෑමයට රු.80 |
| | | 1512.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.110 |
| | 15.13 | | ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, පොල් (කොප්පරා) පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් | |
| | | | පොල් (කොප්පරා) තෙල් හා ඉන් ඉතිරි වූ කොටස් | |
| | | 1513.11 | අශුද්ධ තෙල් | |
| | | | තොග වශයෙන් | |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| | | 1513.11.11 | අදූෂිත පොල් තෙල් | කි.ග්‍රෑමයට රු.110 |
| | | 1513.11.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.110 |
| | | | අනෙකුත් | |
| | | 1513.11.21 | අදූෂිත පොල් තෙල් | කි.ග්‍රෑමයට රු.110 |
| | | 1513.11.29 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.110 |
| | | 1513.19 | අනෙකුත් | |
| | | 1513.19.10 | තොග වශයෙන් | කි.ග්‍රෑමයට රු.110 |
| | | 1513.19.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.110 |
| 11. | 16.04 | 1604.11 | සැමන් | කි.ග්‍රෑමයට රු.100 |
| | | 1604.12 | හුරුල්ලන් | කි.ග්‍රෑමයට රු.100 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | කි.ග්‍රෑමයට රු.100 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටෝ (සර්ඩා විශේෂයේ) | කි.ග්‍රෑමයට රු.100 |
| | | 1604.15 | මැකරල් | කි.ග්‍රෑමයට රු.100 |
| | | 1604.16 | ඇන්චෝවිසි | කි.ග්‍රෑමයට රු.100 |
| | | 1604.17 | ආඳන් | කි.ග්‍රෑමයට රු.100 |
| | | 1604.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.100 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාලු | කි.ග්‍රෑමයට රු.100 |

11 - 967

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.